2011 ජුනි
වෙළුම 8 කාණ්ඩය 1

# තේ තතු

ISSN-1391-6785 ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි.

## පරණ දේ වුනත් - අලුතින් කළොත්.......

තේ ගසට හානි සිදුකරන පලිබෝධයන් පාලනය කිරීම සඳහා නිර්දේශ කරනු ලබන ක්‍රමවේදයන් කලින් කලට විවිධ වෙනස්කම්වලට ලක්වෙනවා. අතීතයේදී නිර්දේශ කරන ලද ඇතැම් පලිබෝධ පාලන ක්‍රමවේදයන්, ප්‍රායෝගිකත්වය හා වගා ක්ෂේත්‍රය තුළ මතුවෙන තත්වයන් සලකා බලා නිර්දේශවලින් ඉවත් කෙරෙනවා. එහෙත් එසේ බැහැර කෙරුණු නැතහොත් අභාවයට ගිය පැරණි පලිබෝධ පාලන ක්‍රමවේද පවා වඩාත් ප්‍රායෝගික ලෙස අලුතෙන් හැඩගස්වා භාවිතයට ගතහොත් අපේක්ෂා නොකළ තරමේ සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකියි.

තේ ටෝට්‍රික්ස් දළඹුවා වඩාත් ප්‍රසිද්ධියට පත්ව තිබෙන්නේ වියළි දේශගුණික තත්ව යටතේ තේ දල්ලට හානි පමුණුවන පලිබෝධයෙක් ලෙසින්. එහෙත් මෑත කාලය තුළ එළැඹුණු දැඩි වැසි සහිත මෝසම් කාල වලදීත් සැලකිය යුතු තරමේ අස්වනු හානියක් මෙම පලිබෝධකයා විසින් ඇති කරනු ලැබුවා. ටෝට්‍රික්ස් දළඹුවා පාලනය කිරීම සඳහා දැනට නිර්දේශිත මෙන්ම බහුලව භාවිත වන මර්දන ක්‍රමවේදයන් වන්නේ පලිබෝධනාශක භාවිතය (Chlorfuazuron ලීටර 1 ක් හෙක්ටයාරයකට) සහ සමීප දලු රවුම් පවත්වා ගැනීමයි.

ටෝට්‍රික්ස් දළඹුවාට එරෙහිව පලිබෝධනාශක යොදාගැනීම අතිශයින් වියදම් අධික ක්‍රමයක්. විශේෂයෙන්ම මෙම පලිබෝධනාශක නිවැරදි අවස්ථාවේදී නොයෙදුවහොත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාදීමට අපොහොසත්ය. හානියේ ආරම්භක අවධියේදී (1cm පමණ වන ඉතා කුඩා දළඹුවන් පත්‍ර අග්‍රය රෝල් කරන අවස්ථාව) නොයෙදුවහොත් පලිබෝධනාශක යෙදීම ඵල රහිත වේ.

ටෝට්‍රික්ස් මර්දනය සඳහා 1935-1945 කාලසීමාවේදී නිර්දේශ කර තිබූ ප්‍රධානතම පාලන ක්‍රමවේදය වුයේ බිත්තර අවස්ථාව හඳුනාගෙන ක්ෂේත්‍රයෙන් ඉවත් කර දැමීමයි. මෙහිදී ටෝට්‍රික්ස් දළඹුවාගේ බිත්තර සහිත මේරූ පත්‍ර තෝරා තේ ගසෙන් කඩා ඉවත් කර පුළුස්සා දැමීමට නිර්දේශ කෙරුණා. විශාල තේ ඉඩම් සඳහා මෙම ක්‍රමය ප්‍රායෝගිකව යොදා ගැනීමට තිබූ අපහසුතාවය නිසාම පලිබෝධනාශක භාවිතය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දක්නට ලැබුණි. එහෙත් මෑතක සිට සිදුවෙමින් පවතින පලිබෝධනාශක වල මිල අධික ලෙස ඉහලයෑම සහ නිමි තේ වල පලිබෝධනාශක ශේෂ වී තිබීම යනාදී ගැටළු හේතුවෙන් මෙම පලිබෝධ පාලන ක්‍රමවේදයක් වඩා ප්‍රයෝගික කළ හැක්කේ කෙසේදැයි සොයා බලන්නට අපි යොමුවුණෙමු.

ටෝට්‍රික්ස් දළඹුවාගේ ජීවන චක්‍රයේ සුහුඹුල් අවධිය සලබයෙකු වන අතර වැඩුණු ගැහැනු සලබයා තේ ගසේ මේරූ පත්‍ර මතුපිට බිත්තර දමනවා. මෙම බිත්තර සමූහ වශයෙන් පවත්නා අතර එවැනි එක් බිත්තර සමූහයකින් කුඩා ටෝට්‍රික්ස් දළඹුවන් 120-150 ත් අතර සංඛ්‍යාවක් පිටවෙනවා. බිත්තර සහිත එක් පත්‍රයක් ඉවත් කිරීම මගින් දළඹුවන් විශාල සංඛ්‍යාවක් ක්ෂේත්‍රයෙන් ඉවත් වී යාම සිදුවෙන නිසා මෙන්ම හානිය සිදු කරන්නා වූ දළ ඹූ අවධිය බිහිවීමට කලින්ම පාලනය කිරීම සිදුවන නිසාත් බිත්තර සහිත පත්‍ර කඩා ඉවත් කිරීම ඉතා සාර්ථක පාලන ක්‍රමයක් වෙනවා. බිත්තර සහිත පත්‍ර නිවැරදිව හඳුනාගත යුතු වීමත්, මේ පිළිබඳ දැනුම ලත් ශ්‍රමිකයන් අවශ්‍ය වීමත් මෙහිදී මතුවෙන ප්‍රයෝගික ගැටළු ලෙස දැක්විය හැකියි.

එහෙත් ඉහත කී අපහසුතා අසීරුවෙන් වුවත් මගහරවා ගතහොත් අතිශයින් සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගත හැකි බව හැටන් - කොටගල පිහිටි ඩේ්‍රටන් වතුයායෙ දී ක්‍රියාවට නගන ලද ක්ෂේත්‍ර ක්‍රියාදාමයක් තුළින් අපට පැහැදිළි වුණා. ඩේ්‍රටන් වතුයායෙහි වතු අධිකාරී එස්. නන්ද කුමාර මහතාගේ මුලිකත්වයෙන් එම වතුයායෙහි ක්ෂේත්‍ර නිලධාරීන්, සහ දළු නෙළ න්නියන් සඳහා අප විසින් වැඩමුලු දෙකක් පවත්වනු ලැබුවා. ක්ෂේත්‍රයේදීම ක්‍රියාත්මක කෙරුණු මෙම වැඩමුලු මගින් ටෝට්‍රික්ස් දළ ඹුවාගේ ජීවන චක්‍රයේ විවිධ අවස්ථා නිවැරදිව හඳුනා ගැනීමටත්, දළු නෙළීම අතරතුරදීම බිත්තර සහිත පත්‍ර කඩා ඉවත් කිරීමටත්, දළු නෙළන්නියන් හා සුපරීක්ෂකවරුන් පුහුණු කරවනු ලැබුවා. වතු අධිකාරීවරයා විසින් හඳුන්වා දෙනු ලැබූ දිරි ගැන්වීමේ පියවරක් තුළින් - එනම් දලු නෙළන්නියන් විසින් එකතු කරන ලබන සෑම ටෝට්‍රික්ස් බිත්තර සමූහ සහිත පත්‍ර 10 ක් වෙනුවෙන් කිකිළි බිත්තරයක් බැගින් ලබාදිම තුළින් අපූරු ප්‍රතිඵල ලැබුණි. බිත්තර සහිත පත්‍ර එකතු කිරීම සිදුකළ යුත්තේ දිනට නියමිත දළු කිලෝ ප්‍රමාණය නෙලීමට අමතර කාර්යයක් වශයෙනි.

දලු නෙළන්නියන් විසින් එකතු කරනු ලබන බිත්තර සහිත පත්‍ර, දලු රවුම අවසානයේදී සුපරීක්ෂකවරුන් වෙත භාර දෙනු ලැබූ අතර ඒවා සටහන් කර ගැනීම සිදු කරනු ලැබුවා. කිසියම් මාසයක් අවසානයේදී අදාල කිකිළි බිත්තර ප්‍රමාණයන් දලු නෙලන්නියන් අතර බෙදා හැරුණා.

සංඛ්‍යාත්මකව සටහන් කළහොත් ඩේ්‍රටන් වතුයායෙහි ශාන්ත ඇන්ඩෲස් කොටස තුලින් පමණක් 2008 නොවැම්බර් මාසය තුළදී එකතු කරනු ලැබූ බිත්තර සහිත පත්‍ර සංඛ්‍යාව 13,640 ක්. දිරිගැන්වීම් වශයෙන් කිකිලි බිත්තර ලබාදීමට වැය වු මුදල රුපියල් 12, 276 ක් වී තිබුණා. 2007 වසරේ නොවැම්බර් මාසයේදී ශාන්ත ඇන්ඩෲස් කොටස තුළ ටෝට්‍රික්ස් පාලනය සඳහා පලිබෝධ නාශක වලට වැය කොට තිබූ මුදල රු 70,000/- කට ආසන්නයි.

පලිබෝධනාශක සඳහා වැය කෙරෙන අධික වියදම ඉතිරිවීම, පලිබෝධනාශක භාවිතය හා ආශ්‍රිත විවිධ ගැටළු මතු නොවීම මෙම ක්‍රමයේ අමතර වාසින්‍ය.

චන්දිමා සේරම් සහ ආචාර්ය සම්පත් වල්ගම




1 **අලුතින්ම දමන ලද ටෝට්‍රික්ස් බිත්තර සමූහයක්**
2 **හොඳින් පරිණත වූ ටෝට්‍රික්ස් බිත්තර සමූහයක්**
3 **දළඹුවන් බිහිවීමට ආසන්න ටෝට්‍රික්ස් බිත්තර සමූහයක්**
4 **දළඹුවන් පිටව ගිය හිස් ටෝට්‍රික්ස් බිත්තර සමූහයක්**